# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2396/07 - 2024 අගෝස්තු මස 05 වැනි සඳුදා - 2024.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**කාර්මික ආරාවුල් පනත (131 වන පරිච්ඡේදය)**
**4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.05.04 වන දින අංක 2382/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2024.04.24 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශ්වයක් වශයෙන්,

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය,
141, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්,
   රෝහල පාර, හසලක.
2. සුමිත්‍රා හසලක (ප්‍රයිවට්) ලිමිටඩ්,
   33, තෙලඟපාත පාර, වත්තල.

අතර පවත්නා 2024.04.10 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ පාලිත සේනාධීර මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ පාලිත සේනාධීර මයා එම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2024.04.24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0062


1A - G 42396 — 09 (2024/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*